# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1984 අංක 21 දරන
# ලංකා හෝටල් පාසලේ උපාධිධරයන්ගේ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1984 ජූනි මස 06 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1984 ජූනි මස 08 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : ශත 60 යි | තැපැල් ගාස්තුව : ශත 60 යි

# 1984 අංක 21 දරන ලංකා හෝටල් පාසලේ උපාධිධරයන්ගේ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1984 ජූනි මස 06 වන දින]

එල්. ඩී.—ඕ. 59/83

**ලංකා හෝටල් පාසලේ උපාධිධරයන්ගේ සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"ලංකා හෝටල් පාසලේ උපාධිධරයන්ගේ සංගමය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක් ඒ සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව ඒ සංගමයට සම්බන්ධ සියලු පරමාර්ථ හා කරුණු සඵලාකාරයෙන් ක්‍රියාත්මක කිරීමේ හා කර ගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබුණු හෙයින් ද: පූර්විකාව.

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ගෙන ගොස් ඇති හෙයින් සහ එකී සංගමය සංස්ථාගත කිරීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන අර්ථ සිද්ධිය සඳහා වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 1984 අංක 21 දරන ලංකා හෝටල් පාසලේ උපාධිධරයන්ගේ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) ලංකා හෝටල් පාසලේ උපාධිධරයන්ගේ සංගමයේ දැනට සාමාජිකයන්ව සිටින හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් සංඛ්‍යාව, මේ පනත ආරම්භ වන දිනයෙහි සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "ලංකා හෝටල් පාසලේ උපාධිධරයන්ගේ සංගමය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් බවට පත් විය යුතු අතර, එම සංස්ථාපිත නාමයෙන් එය විසින් හා එයට විරුද්ධව සියලු අධිකරණයන්හි නඩු පවරනු ලැබිය හැකි ය. තව ද පොදු මුද්‍රාවක් තබා ගැනීමට හා එය පාවිච්චි කිරීමට ද සංස්ථාවේ කැමැත්ත පරිදි එය වෙනස් කිරීමට ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. ලංකා හෝටල් පාසලේ උපාධිධරයන්ගේ සංගමය සංස්ථාගත කිරීම.

**3.** සංස්ථාව පිහිටුවනු ලබන්නේ කවර පරමාර්ථ සඳහා ද ඒ පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) ලංකා හෝටල් පාසලේ උපාධිධරයන් තුළ ඔවුනොවුන් අතර සහ හෝටල් පාසල සමග අන්‍යෝන්‍ය සුහදතාවය වැඩි දියුණු කිරීම;

(ආ) ලංකා හෝටල් පාසලේ අභිවෘද්ධිය සඳහා ආධාර කිරීම;

(ඇ) සංචාරක ව්‍යාපාරය වැඩි දියුණු කිරීමෙහි ලා ආධාර කිරීම; සහ

(ඈ) ලංකා හෝටල් පාසලේ උපාධිධරයන්ගේ ශුභසිද්ධිය සඳහා ආධාර කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. සංස්ථාවේ පරමාර්ථ ඉටු කිරීම සඳහා අවශ්‍ය බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වා ගෙන යාමේ සහ වැසීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද ප්‍රදානයන් සහ පරිත්‍යාග භාර ගැනීමේ සහ එකතු කිරීමේ ද සංස්ථාවේ අරමුදල් ආයෝජනය කිරීමේ ද සේවක පිරිස් නියුක්ත කර ගැනීමේ, සේව යෙහි යෙදවීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය හෝ හිතකර කවර ආකාරයක හෝ සියලු ක්‍රියා කිරීමේ ද කරුණු ඉටු කිරීමේ ද දේවල් ක්‍රියාවේ යෙදීමේ ද බලය, මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

5. (1) සංස්ථාවේ කටයුතු, සංස්ථාවේ රීතිවලින් විධිවිධාන සලස්වා ඇති පරිදි වූ සහ ඒ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන තැනැත්තන් සංඛ්‍යාවකින් සමන්විත වූ විධායක කමිටුවක් විසින් එකී රීතිවලට යටත්ව පරිපාලනය කළ යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන අවස්ථාවේ දී ධුර දරන සංස්ථාවේ විධායක කමිටුව සංස්ථාවේ ප්‍රථම විධායක කමිටුව විය යුතුය.

සංස්ථාවේ රීති.

6. (1) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා සංස්ථාව විසින් කලින් කල සාමාජිකයන්ගේ මහා සභා රැස්වීමක දී ඡන්දය දීමට හිමිකම ඇති සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන්, සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම, විශ්‍රාම ගැනීම හෝ ඔවුන් නෙරපීම සඳහා ද සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා සහ සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා ද මේ පනතේ විධිවිධානවලට හා ප්‍රතිපත්තිවලට අනනුකූල නොවන රීති සාදනු ලැබීම නීත්‍යනුකූල වන්නේ ය. එකී රීති සෑදීමෙන් පසු, එවැනි ම රැස්වීමක දී ඒ ආකාරයෙන් ම ඒවා වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(2) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංගමය විසින් ගෙවිය යුතු සහ සංගමයට අය විය යුතු ණය.

7. මේ පනත ක්‍රියාත්මක වන වේලාවේ දී පවත්නා වූ සංගමයේ සියලුම ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර සංගමයට අය විය යුතු සියලු ණය හෝ ගෙවිය යුතු දායක මුදල් සහ සාමාජික මුදල් සංස්ථාවට ගෙවිය යුතු ය.

සංස්ථාවේ ආදායම් සහ දේපළ යෙදවීම.

8. සංස්ථාවේ ආදායම සහ දේපළ හුදෙක් සංස්ථාවේ පරමාර්ථ නංවාලීම පිණිසම යොදා ගත යුතු අතර ඉන් කිසිම කොටසක් සංස්ථාවේ සාමාජිකයන්ට ලාභාංශ, ප්‍රසාද මුදල් හෝ වෙනත් ලාභ වශයෙන්, කෙළින්ම හෝ අන්‍යාකාරයකින් ගෙවීම හෝ පැවරීම කරනු නොලැබිය යුතු ය:

එසේ වුව ද මේ වගන්තියේ විධිවිධාන මගින්—

(අ) සංස්ථාවට කරන ලද යම් සේවාවක් වෙනුවෙන් සංස්ථාවේ යම් නිලධරයකුට හෝ සේවා නියුක්තයකුට හෝ සංස්ථාවේ යම් සාමාජිකයකුට, සද්භාවයෙන් යම් සාධාරණ සහ නිසි පාරිශ්‍රමිකයන් ගෙවීම;

(ආ) තම කටයුතු හෝ යුතුකම් ඉටු කිරීමෙහිලා හෝ සංස්ථාවේ පරමාර්ථ නංවාලීමෙහිලා, සංස්ථාවේ යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවා නියුක්තයකු විසින් දරන ලද වියදම් ඔහුට ගෙවීම

නොවැළැක් වේ.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**9.** මිලට ගැනීමකින්, ප්‍රදානයකින්, ත්‍යාගයකින්, තෙස්තමේන්තු නියාදනයකින් හෝ වෙනත් යම් ආකාරයකින් සංස්ථාව වෙත පැවරෙන යම් නිශ්චල හෝ චංචල දේපළක් භාර ගැනීමට හා දැරීමට සංස්ථාවට නීතියෙන් බලය ඇති අතර, එවැනි සියලු දේපළ මේ පනතේ කාර්ය සඳහා ද සංස්ථාවේ එවකට බලපවත්නා රීතිවලට යටත්ව ද ඒ දේපළ උකස් කිරීමේ, විකිණීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සහිතව සංස්ථාව විසින් දැරිය යුතු ය.

සංස්ථාවේ සාමාජිකයන්ගේ වගකීම.

**10.** යම් සාමාජිකයකුගෙන් සංස්ථාවට අය විය යුතු යම් වාර්ෂික දායක මුදලක ප්‍රමාණය සහ රුපියල් පනහකට වැඩි නොවූ අතිරේක මුදල් ප්‍රමාණයක් ද ඉක්ම වූ යම් සම්මාදම් මුදලක්, සංස්ථාවේ ණය සහ බැරකම් ගෙවා නිදහස් කිරීම සඳහා ගෙවීමට සංස්ථාවේ කිසිදු සාමාජිකයකු බැඳී නැත.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුත්තේ කෙසේ ද යන වග.

**11.** සංස්ථාවේ විධායක කමිටුවේ යෝජනා සම්මතයක බලය යටතේ සහ තත් කාර්යය සඳහා සංස්ථාවේ රීතිවලට අනුව යථා පරිදි බලය පවරනු ලැබූ විධායක කමිටුවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රයකට සංස්ථාවේ මුද්‍රාව නොතැබිය යුතු ය. ඒ සාමාජිකයන් දෙදෙනා පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. තව ද එසේ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සනකට පරිබාහිරව විය යුතු ය.

විසුරුවා හැරීමෙන් පසු ඉතිරි වන දේපළ.

**12.** සංස්ථාව විසුරුවා හරිනු ලැබූ විට, එහි සියලුම ණය සහ බැරකම් ගෙවා සමථයකට පත් කරනු ලැබීමෙන් පසු, කවර වුව ද දේපළක් ඉතිරි වේ නම්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා නොදිය යුතු අතර සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද යම් ආදායමක් හෝ දේපළක් තම සාමාජිකයන් අතර බෙදාදීම ස්වකීය රීති මගින් තහනම් කර ඇත්තා වූ ද වෙනත් යම් සංගමයකට හෝ සංගම්වලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු

ලැබිය යුතු ය. ඒ සංගමය හෝ සංගම් කවරේද යන්න සංස්ථාව විසුරුවා හරින වේලාවේදී හෝ ඊට පෙරාතුවම හෝ සංස්ථාවේ සාමාජිකයන් විසින් තීරණය කළ යුතු ය. එසේ කිරීම පැහැර හරින ලද අවස්ථාවක දී ඒ දේපළ නැතහොත් ඉන් යම් කොටසක් දරන හෝ පිහිටි ප්‍රදේශයක විෂයෙහි සිවිල් අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් ඒ සංගමය හෝ සංගම් කවරේදැයි තීරණය කළ යුතු ය. ඒ දේපළ හෝ ඉන් යම් කොටසක් මේ වගන්තියේ විධිවිධාන ප්‍රකාර නියාදනය කළ නොහැකි වේ නම්, ඒ දේපළ හෝ ඒ කොටස යම් පුණ්‍ය කටයුත්තක් සඳහා යෙදවිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**13.** මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම් වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.